සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

8 ශ්‍රේණිය — කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. ලූක්තුමා තම සුබාරංචි කෘතිය පිළිගන්වනු ලබන්නේ,

(1) ජුවාම් තුමාට ය. (2) ශ්‍රීමත් තියෝපිලස් තුමාට ය.
(3) දෙවන ජුවාම් පාවුළු තුමාට ය. (4) සිමියොන් තුමාට ය.

02. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන සුබාරංචි කතුවරු වන්නේ,

(1) ශු. මතෙව් තුමා හා ශු. ලූක් තුමා ය. (2) ශු. මතෙව් තුමා හා ශු. ජොහාන් තුමා ය.
(3) ශු. ලූක් තුමා හා ශු. මාක් තුමා ය. (4) ශු. මතෙව් තුමා හා ශු. මාක් තුමා ය.

03. සුබාරංචිය පතල කිරීමට අප යොදාගත යුතු වන්නේ,

(1) අපගේ ශක්තිය ය. (2) මිල මුදල් ය.
(3) අපගේ හැකියා හා දක්ෂතා ය. (4) අපගේ කාලය ය.

04. ලූක් සුබාරංචියේ ආරම්භක සිද්ධිය මේ අතරින් කුමක්ද?

(1) ජේසුස් වහන්සේගේ වංශාවලිය. (2) ස්නාවක ජොහාන් තුමාගේ දේශනය.
(3) ස්නාවක ජොහාන් තුමාගේ උපත (4) සෙකරියස් තුමාගේ යාග පූජාව

05. දාවිත් රජතුමාගෙන් ගැලවුම්කරුවාණන් පැමිණෙන බව ප්‍රකාශකරන ලද දිවැසිවරයා වන්නේ,

(1) නාතාන් දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.
(3) මීකා දිවැසිවරයා ය. (4) ජෙරමියා දිවැසිවරයා ය.

06. ලූක් සුබාරංචිය යාච්ඤාවේ සුබාරංචිය ලෙස හඳුන්වා ඇත්තේ,

(1) අපි යාච්ඤාවට මුල් තැන දිය යුතු බැවිනි.
(2) යාච්ඤාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇති බැවිනි.
(3) කිතුණු අපට යාච්ඤාව අත්‍යවශ්‍ය බැවිනි.
(4) සුබාරංචිය යාච්ඤාවකින් ආරම්භ කර ඇති බැවිනි.

07. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරනු ලබන්නේ,

(1) ජෙරුසලමෙනි. (2) ජ්‍යොදොන් තොටුපොළෙනි.
(3) ගලීලයෙනි. (4) බෙත්ලෙහෙමෙනි.

08. ''එම්මානුවෙල්'' යන නමෙහි අර්ථය වන්නේ,

(1) 'ජේසුස් වහන්සේ අප සමඟය.' (2) 'ශුද්ධාත්මයාණන් අප සමඟය.'
(3) 'දෙවියන් වහන්සේ අප ගලවන සේක.' (4) 'දෙවියන් වහන්සේ අප සමඟය.'

09. දෙවියන් වහන්සේ කී දෙය අවිශ්වාස කළ බැවින් ගොලු බවට පත් වූයේ,

(1) සිමියොන් තුමා ය. (2) සෙකරියස් තුමා ය.

(3) ආබ්‍රහම් තුමා ය. (4) ජුසේ තුමා ය.

10. මරියතුමියගේ ඥාතිවරිය වන්නේ,

(1) එළිසබෙත් තුමියයි. (2) අන්නා තුමියයි.

(3) වෙරෝනිකා තුමියයි. (4) ආනා තුමියයි. (ල. 2x10 = 20)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැලපෙන පිළිතුර ලියන්න.**

11. ලූක් පමණක් මා සමඟ සිටි. ............................................................ ඔබ සමඟ කැඳවාගෙන එන්න.

12. ............................................................ සුබාරංචිය දයාවේ සුබාරංචිය ලෙස ද හඳුන්වනු ලබයි.

13. ජේසුස් වහන්සේගේ උපත පළමුවෙන් ම ප්‍රකාශ කළේ ............................................................ ය.

14. ජුදා සමාජයේ ............................................................................ පව්කරුවන් ලෙස සලකුහ.

15. තමන් සතු දෙය ............................................................................ පරිහරණය කළ යුතුය.

(එඬේරුන්ට, වගකීමෙන්, මාක්, අයකැමියන්, ලූක්, සතුටින්)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාවෙන් නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වා දෙයි. ( )

17. සෙකරියස් තුමාගේ යාගය තුළින් ලූක් සුබාරංචියේ පණිවිඩයක් වන ප්‍රීතිය හා තුති පැසසුම් ඉදිරිපත් කරයි.

( )

18. ජෝසප් දාවිත්ගේ වංශය හා පෙළපතට අයත් වූ අයෙකි. ( )

19. පාළුකරයේ මොරගසන හඬ ජේසුස් වහන්සේව හඳුන්වන්නේ නාතාන් දිවැසිවරයාය. ( )

20. ක්‍රියා පොත හා ලූක් සුබාරංචියේ කතුවරයා ලූක් තුමා බව භාෂා ශෛලිය තුළින් පෙන්නුම් කරයි. ( )

(ල. 5x2 = 10)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (1) ස්නාවක ජොහාන් තුමාගේ දෙමාපියන් නම් කරන්න.
(2) ජුසේ තුමා හා මරියතුමිය ජේසුස් වහන්සේට කැප කිරීමට රැගෙන ගියේ කුමන ස්ථානයටද?
(3) ලූක් සුබාරංචිය සම්පාදනය වූ කාල වකවානුව ලියන්න.
(4) ඉශ්‍රායෙල්වරුන්ගේ විමුක්ති අපේක්ෂාවෙන් සිටි ජෙරුසලම් දේවමාලිගාවේ සිටි දිවැසිවරයා කවුරුන්ද?
(5) ලූක් සුබාරංචියේ සඳහන් වන ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 02 ක් ලියන්න.
(6) ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ ලූක්තුමා ඉදිරිපත් කරන කරුණු 02 ක් ලියන්න.
(7) ආබ්‍රහම්තුමා දෙවියන් වහන්සේ වෙනුවෙන් අත්හල දේවල් 02 ක් ලියන්න.
(8) ස්නාවක ජොහාන් තුමා ජනතා මෙහෙවර ආරම්භ කළේ කුමන ප්‍රදේශයෙන්ද?
(9) දේව සැලැස්මට අනුකූලව ජීවත් වීමට ඔබට කළ හැකි දේවල් 02 ක් ලියන්න.
(10) ලූක් තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න. (ල. 2x10=20)

02. (1) ලූක් සුබාරංචියේ සංකේතය කුමක්ද? (ල. 02)
(2) පාවුලු තුමා සමඟ ලූක් තුමා සිරගතව සිටි බවට සාක්ෂි 03 ක් ලියන්න. (ල. 03)
(3) ජේසුගේ ආදරය අන්‍යයන් වෙත ගෙන යාමට ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

03. (1) ජේසුස් වහන්සේ පිළිගැනීමට ජනතාවට සූදානම් කිරීමේ වගකීම පැවරී තිබුණේ කාටද? (ල. 02)
(2) ජේසුස් වහන්සේගේ කාලයේදී පලස්තීනය බෙදන ප්‍රධාන කොටස් 03 ක් ලියන්න. (ල. 03)
(3) පහත සඳහන් ස්ථාන ජේසුස් වහන්සේගේ ජීවිතය හා බැඳී ඇති ආකාර 02 බැගින් ලියන්න.
1) ගලීලය 2) ජෙරුසලම (ල. 05)

04. (1) ලූක් සුබාරංචියේ පරමාර්ථය කුමක්ද? (ල. 02)
(2) ලූක් සුබාරංචිය හඳුන්වන වෙනත් නම් 03 ක් ලියන්න. (ල. 03)
(3) කොන්වූවන්ගේ සුබාරංචිය තුළින් ලූක් තුමා ඉදිරිපත් කරනු ලබන සකෙවුස් පිළිබඳ කථා පුවත ඔබේ වචනයෙන් ලියන්න. (ල. 05)

05. (1) ගැලවීම් ඉතිහාසය සූදානම් කිරීමට දෙවියන් වහන්සේ තෝරාගනු ලැබූ ආදිපිතෘවරයා කවුරුන්ද? (ල. 02)
(2) මෙසියස් වහන්සේ පිළිබඳ දිවැස් වැකි ඉදිරිපත් කළ දිවැසිවරු තිදෙනා නම් කරන්න. (ල. 03)
(3) පහත අවස්ථාවලදී දේව දරුවෙකු ලෙස ඔබ ක්‍රියාකරන ආකාර 02 බැගින් ලියන්න.
1) පන්ති නායකයෙකු ලෙස 2) පාසලේ ක්‍රීඩා නායකයෙකු ලෙස
3) දහම් පාසල් දරුවෙකු ලෙස (ල. 05)

06. (1) ස්නාවක ජොහාන් තුමාට පැවරුනු දේව කාර්ය කුමක්ද? (ල. 02)
(2) ස්නාවක ජොහාන් තුමා තම දේශන ලබා දුන් කණ්ඩායම් 03 ලියන්න. (ල. 03)
(3) ස්නාවක ජොහාන් තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 2 ) 02. ( 1 ) 03. ( 3 ) 04. ( 4 ) 05. ( 1 ) 06. ( 2 ) 07. ( 3 ) 08. ( 4 ) 09. ( 2 ) 10. ( 1 )

11. මාක් 12. ලූක් 13. එඬේරුන්ට 14. අයකැමියන් 15. වගකීමෙන්

16. (✓) 17. (X) 18. (✓) 19. (X) 10. (✓)

## II කොටස

01. (1) එළිසබෙත් තුමිය හා සෙකරියස් තුමා

(2) ජෙරුසලමේ දේව මාලිගාවට

(3) ක්‍රි.ව. 80 - 85

(4) සිමියොන්

(5) ★ බෞතිස්මය ලබන අවස්ථාව ★ අපෝස්තුළුවරුන් තෝරා ගැනීමට පෙර ★ ස්වර්ගයෙහි වැඩසිටින යාච්ඤාව ඉගැන්වූ අවස්ථාවේ. (පිටු අංක 07)

(6) ★ ජේසුස් වහන්සේගේ උපත ★ ජේසුස් වහන්සේගේ දේව මාලිගාවේ කැප කිරීම ★ ජේසුස් වහන්සේගේ ළමා විය ★ වයස අවු: 12 දී දෙමාපියන්ගෙන් මඟ හැරී නැවත දේව මාලිගාවේදී සොයා ගනු ලැබීම. (පිටු අංක 15)

(7) මව්බිම, නැදැයින්, පියාගේ ගෘහය.

(8) ඒනෝන් තොටුපොළ ආශ්‍රිතව

(9) ★ යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම. ★ දේව හඬට කීකරු වීම. ආදී සිසුවා ලියාඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න.

(10) ★ දේව වචනය අන්අයට බෙදා දීම. ★ අභියෝගවලට මුහුණ දීම. ආදී සිසුවා ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න. (ල. 2x10=20)

02. (1) ගවයා (ල. 02)

(2) ★ ලූක් පමණක් මා සමඟ සිටී. මාක් ඔබ සමඟ කැඳවාගෙන එන්න. මාගේ වැඩට ඔහු ප්‍රයෝජනවත් සහකාරයෙක්. ★ මාගේ හවුල් සේවකයන් වන මාක්ද, ලූක් ද, ඔබට ආචාර කරති. ★ අපේ හිතවත් ලූක් නම් වෛද්‍යවරයාද ඔබට ආචාර කරති. (පිටු අංක 2) (ල. 03)

(3) ★ සියළු දෙනාට එක ලෙස සැලකීම. ★ සමාජයේ කොන්වූවන් පිළිගැනීම. ★ අසරණයන්ට පිහිට වීම. ★ සුබාරංචිය අන් අයට කියා දීම. ★ දිව්‍ය පූජාවට සහභාගී වීම. ආදී සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

03. (1) ස්නාවක ජොහාන් තුමාය. (ල. 02)

(2) ගලීලය, සමාරිය, ජුදය (ල. 03)

(3) 1) ගලීලය ★ ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කිරීම. ★ උන්වහන්සේගේ ඉගැන්වීම් හා සුවකිරීම් සම්බන්ධ තොරතුරු

2) ජෙරුසලම ★ ජේසුස් වහන්සේ ජෙරුසලමේ කළ සේවය. ★ ජේසුස් වහන්සේ ගොබ් ඉරුදින කොටළුවකු පිට නැඟ ජෙරුසලමට පිවිසීම. (පිටු අංක 16 - 17) (ල. 05)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

04\. (1) ජේසුස් වහන්සේ ජුදා ජනතාවගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේම ගැලවුම්කරුවා බව. (ල. 02)

(2) යාච්ඤාවේ සුබාරංචිය, කාන්තාවන්ගේ සුබාරංචිය, දයාවේ සුබාරංචිය (පිටු අංක 7) (ල. 03)

(3) සකේවුස්ගේ සිත් හැරීම (පිටු අංක 10) (ල. 05)

05\. (1) ආබ්‍රහම්තුමා (ල. 02)

(2) නාතාන්, යෙසායා, මීකා (ල. 03)

(3) 1) පන්ති නායකයෙකු ලෙස

★ සැමට එකලෙස සැලකීම. ★ වගකීම් නිසි ලෙස ඉටු කිරීම.

2) පාසල් ක්‍රීඩා නායකයෙකු ලෙස

★ ජය පරාජය සතුටින් භාර ගැනීම. ★ තම හැකියාවන් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.

3) දහම් පාසල් දරුවෙකු ලෙස

★ දහම් පාසල් යාම. ★ තමන්ට පැවරෙන වගකීම් නිසි ලෙස ඉටු කිරීම. ★ සියලු දෙනාට සහෝදරත්වයෙන් සැලකීම. ආදී සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

06\. (1) මෙසියස් වහන්සේගේ එනම් වඩින්නට සිටි තැනැන් වහන්සේ වූ ජේසුස් වහන්සේගේ පෙරමඟ සූදානම් කිරීම. (ල. 02)

(2) ★ සාමාන්‍ය ජනතාව (නොසන්සුන් වූ ජනතාව) ★ අයකැමියන් ★ හමුදා නිළධාරීන්. (පිටු අංක 29) (ල. 03)

(3) ★ සරලබව ★ සත්‍යයට සාක්ෂි දැරීම. ★ අභියෝග ජය ගැනීම. ★ වැරදි කරන ලද පුද්ගලයන් යහමඟට ගැනීම. ★ දෙවියන් වහන්සේ මත යැපීම. ආදි සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)